# බෝධිසත්ත්ව සංකල්පය - පාලි මූලාශ්‍රය

පාලි මූලාශ්‍රයවල අන්තර්ගත බෝධිසත්ත්ව සංකල්පය එක් යුගයකට අයත් නැති බවත් එම සංකල්පය හා සම්බන්ධ වාර්තාවල ඇති සංවර්ධනාත්මක ස්වරූපය අනුව ඒවා ක්‍රමානුකූලව විකාශනය වන්නට ඇති බවත් කල්පනා කළ හැකිය. බුදුරදුන් උත්තරීතර මිනිසකු වශයෙන් දක්වෙන වාර්තා සහ මූලාශ්‍රය මුල්ම යුගයටත් බුද්ධ චරිතයේ වඩා ආශ්චර්යවත් අද්භුත සිදුවීම් හා දෙවියන් සම්බන්ධ වාර්තා තවත් අවස්ථාවකටත් වෙන් කළ හැකිය. බුදුරදුන්ගේ මානුෂීය ලක්ෂණ ඉස්මතු කෙරෙන සූත්‍ර වශයෙන් මජ්ඣිම නිකායයේ අරියපරියේසන, අංගුත්තර නිකායේ දේවදූත වර්ගයේ 7 වන සූත්‍රය, සුත්ත නිපාතයේ පබ්බජ්ජා යන සූත්‍රයන් සඳහන් කළ හැකිය. අරියපරියේසන සූත්‍රයේ දක්වෙන්නේ ඉතා සරල බුද්ධ චරිතයකි. උදාහරණ වශයෙන් එහි බෝසතුන්ගේ අභිනිෂ්ක්‍රමණය පෙන්වා දිය හැකිය.[1] එහි දේව මාරාදී කිසිවකු ගැන සඳහන් නොවේ. දෙමවුපියන් අඬමින් සිටියදී විශ්වසනීය ලෙස අභිනිෂ්ක්‍රමණය සිදුවී ඇති බව වාර්තා වේ. මේ සූත්‍රයේ ඇති අවිශ්වසනීය සිද්ධි ද්වයය නම් සහම්පති මහා බ්‍රහ්මයා විසින් බුදුරදුන්ට දම් දෙසීමට කරනු ලබන ආරාධනාව[2] සහ මාරයා පිළිබඳව පසුව එන සඳහනය.[3] පාලි ගාථා 19 ක් පමණ වූ සුත්ත නිපාතයේ පබ්බජ්ජා සූත්‍රයේ අරමුණ සිද්ධාර්ථ බෝසතුන් හා බිම්බිසාර රජුගේ හමුවීම වාර්තා කිරීම බව ප්‍රකට වේ. එහි මාර දේවාදීන් හා අනවශ්‍ය විස්තර වර්ණනාදිය විද්‍යමාන නොවේ.[4] බුද්ධත්වයට පෙර බෝසත් අවධිය මෙම සූත්‍රයේ හඳුන්වා ඇත්තේ බුද්ධ යන නාමයෙන්ය.[5] එසේම[6] මුනි භික්ඛු[7] යන නාමයන් ද පර්යාය වශයෙන් යොදා ඇත. බෝධිසත්ත යන වචනය සිදුහත් කුමරුගේ උපතේ සිට බුද්ධත්වය දක්වා වූ කාලය සඳහා භාවිතයට ගෙන නොතිබුණු යුගයක පබ්බජ්ජා සූත්‍රය සකස් කරන්නට ඇතැයි ප්‍රකාශ කළ හැකි වුවත් එය කොතරම් සත්‍යයට සමීප වන්නේ දැයි යන ගැටලුව මතුවන්නේ මජ්ඣිම නිකායයේ ආරියපරියේසන වැනි මුල් යුගයට අයත් සූත්‍රවල බෝධිසත්ත්ව යන වචනය ඉතා පැහැදිලිවම සඳහන් වීම නිසයි. පබ්බජ්ජා සූත්‍රයේ භාෂාව අනුව එය ත්‍රිපිටකයේ පුරාණතර ස්තරයට අයත් සූත්‍රයක් වශයෙන් මහාචාර්ය එන්.ඒ. ජයවික්‍රම සඳහන් කරයි.[8] එසේම එහි අන්තර්ගත දෙබස් සහිත ගාථා ආදිකාලීන බැව් නිගමනය කළ හැකි වුවත් එහි සමහර පද බුදු රදුන් පිළිබඳ දියුණු අදහස් ඉදිරිපත් කරන බව එතුමා තව දුරටත් පෙන්වා දෙයි.[9] උදාහරණ වශයෙන් 4 වන ගාථාවේ එන ''ආකිණ්ණවර ලක්ඛණො''[10] යන පදයත් 5 වැනි ගාථාවේ එන ''ලක්ඛණ සම්පන්නං''[11] යනාදී පදත් පෙන්වා දී ඇත. එහෙත් එය බුදුරදුන්ගේ දෙතිස් මහා පුරුෂ ලක්ෂණ පිළිබඳ වර්ධනීය අවස්ථාවක් ප්‍රකාශ කිරීමකට වඩා ප්‍රාථමික මුල් අවස්ථාවක් ප්‍රකාශ කිරීමක් බව සිතීමට ඉඩකඩ තිබේ. මෙම සූත්‍රයේ 16 වැනි ගාථාවෙන් බෝසතුන්ගේ නව යොවුන් බව හා ආරෝහපරිණාහ සම්පත්තිය ප්‍රකාශ කර ඇත.[12] එසේම 17 වැනි ගාථාවේ ''නාගසංඝ පුරක්ඛතො''[13] යන්නෙන් ඇතුන් නමැති සංඝයා පෙරමුණු කොට යන අදහස දෙන බව මහාචාර්ය එන්.ඒ. ජයවික්‍රම පවසයි.[14] එය එසේ නම් සංඝ සමාජය පහළ වීම තෙක් මෙම සූත්‍රය සකස් නොවීද යන සැකය මතුවේ. සූත්‍රයේ සන්දර්භයට අනුව එහි අදහස ඇත් සමූහයා පෙරටු කොට යනුවෙන් ගැනීම වඩාත් උචිත යැයි සිතේ. එය බොහෝ පරිවර්තනවල දී ඇති අදහසයි.[15] බුද්ධ චරිතය වස්තු විෂය කර ගත් මහා කාව්‍ය දියුණු වූයේ ආදිකාලීන කථා කාව්‍යයක් වූ පබ්බජ්ජා සූත්‍රයේ අනුසාරයෙන් බව වින්ටර්නීට්ස් පවසයි.[16]

පබ්බජ්ජා සූත්‍රය සුත්ත නිපාතයේ මහා වග්ගයේ පළමු සූත්‍රයයි. මහාවග්ගය ද අට්ඨක වග්ගය තරම්ම පැරණි යැයි එහි එන භාෂාව හා අන්තර්ගතය අනුව ෆවුස් බෝල් පවසයි.[17] මහා වග්ගය එතරම්ම පැරණි විය නොහැකි වුව ද එහි සමහර සූත්‍ර පෞරාණික ලක්ෂණ දරන බව ඔලිවර් අබේනායක පවසයි.[18] පබ්බජ්ජා සූත්‍රයේ ඓතිහාසිකත්වය විශ්වාස කිරීමට අපහසු බවත් බුදුරදුන්ගේ මහත් කීර්තිය උදෙසා එය නිෂ්පාදනය කරන ලද්දක් බවත් පාණ්ඩේ පවසයි.[19] මෙම සූත්‍රයෙන් ඉදිරිපත් කෙරෙන බුදුරදුන්ගේ පුරාවෘත්තය දීඝ හා මජ්ඣිම නිකායික සූත්‍රයන්ට වඩා අඩුවෙන් සංවර්ධනය වී ඇතත් එය පැරණිම නිකාය ස්තරයට අයත් කළ නොහැකි බව වින්ටර්නීට්ස් පවසයි.[20] එහෙත් පබ්බජ්ජා සූත්‍රයේ භාෂාව හා අන්තර්ගතය අනුව එය අයත් කළ යුත්තේ අරියපරියේසනාදී සූත්‍ර රචිත මුල් වකවානුවටය.

බෝධිසත්ව සංකල්පය සම්බන්ධ වර්ධනීය හා දියුණු අදහස් විද්‍යමාන සූත්‍ර ත්‍රිපිටකයේ විසිරී ඇති බෝසතුන් සාමාන්‍ය උත්තරීතර මිනිසකු වශයෙන් හඳුන්වනවාට වඩා ආශ්චර්යජනක අද්භූත පුද්ගලයකු වශයෙන් ඉස්මතු කිරීම මෙම මූලාශ්‍රයවල අරමුණ වී ඇත. එහි දී දේව මාරාදීන්ගේ සම්බන්ධය ද පෙන්වා උන්වහන්සේ දෙවියන්ට වඩා උසස් තත්වයට පත් කර ඇත. එබඳු අවස්ථා රාශියක් සූත්‍ර හා විනය පිටක පුරා විසිරී පවතින අතර ඉන් සමහරක් වශයෙන් පහත සඳහන් සූත්‍ර පෙන්වා දිය හැකිය. එනම් දීඝ නිකායේ මහාපදාන, මහාගෝවින්ද, මහාසුදස්සන, මජ්ඣිම නිකායේ මහා සච්චක, බෝධිරාජ කුමාර, අච්ඡරිය අබ්භූත යනාදී සූත්‍රයි. එසේම සුත්ත නිපාතයේ නාලක, පදාන වැනි සූත්‍ර ද ඇතුළත් කළ හැක්කේ මෙම වර්ධනීය ලක්ෂණ සහිත මූලාශ්‍රය අතරටමය. දීඝ නිකායේ මහාපදාන සූත්‍රයේ ආශ්චර්ය අද්භූත සිදුවීම් තුළින් බුද්ධ චරිතය සරසා ඇත. විශේෂයෙන්ම මවුකුස පිළිසිඳ ගැනීම හා උපත පූර්ව නියමයක් හා පැතුමක් අනුව සිදුවන බව එහි සඳහන් වේ. එල්.ඒ.වෙඩ්ල්ගේ අදහස වන්නේ මෙම මහාපදාන සූත්‍රය හා ලලිත විස්තර එකම පොදු මූලාශ්‍රයක් පදනම් කරගෙන රචනා කරන්නට ඇති බවත් එසේම එය ක්‍රි.පූ. 2-1 සියවස් අතර සම්ප්‍රදායට අයත් බවත්ය.[21] වින්ටර්නීට්ස්ගේ අදහස වන්නේ ද මෙම මහාපදාන සූත්‍රය පශ්චාත් කාලීන බවයි.[22] ජී.සී. පාණ්ඩේ පවසන්නේ ද මෙම සූත්‍රයේ මහාපදාන යන නාමයට එහි පශ්චාත් කාලීනත්වයට හොඳ සාධකයක් බවය.[23] ඊට හේතුව අවදාන (සාහිත්‍යය) ජනප්‍රිය වන්නේ පසු කාලයක වීම බව හේ ප්‍රකාශ කරයි.[24] එසේම එහි එන බෝසතුන් සම්බන්ධ සදාතනික න්‍යායයන් (ධම්මතා), පූර්ව බුදුවරුන් සදෙනෙකු දක්වා වර්ධනය වීම දෙතිස් මහා පුරුෂ ලක්ෂණ විස්තරව තිබීම විපස්සී බුදුරදුන්ගේ චරිතය සම්පූර්ණව ඉදිරිපත් කර තිබීම යන ලක්ෂණ ද මෙම සූත්‍රයේ පශ්චාත් කාලීන ස්වභාවයට සාධක බව පෙන්වා දිය හැකිය. බෝසතුන් සම්බන්ධව එන ''ධම්මතා'' යන අදහස සම්පූර්ණයෙන්ම ත්‍රිපිටකයේ මුල් සූත්‍රවලට අලුත් බව පවසයි.[25] බෝසතුන් තමන් දැනුවත්වම මවුකුස පිළිසිඳ ගැනීම, පොළොව කම්පා වීම, බෝසත් මවට පුරුෂ සංසර්ග චිත්තය නොමැති වීම, බෝසතුන් බිහි වී සතියකින් මව මිය යෑම, පළමු කොට දෙවියන් විසින් පිළිගැනීම, උපන් ක්ෂණයෙහි උතුර බලා ගමන් කිරීම හා ශ්‍රේෂ්ඨ බව ප්‍රකාශ කිරීම වැනි ලක්ෂණ මෙම සූත්‍රයේ ධර්මතා වශයෙන් ඉදිරිපත් කර ඇත.

කෙසේ නමුත් දීඝ නිකායේ මහාපදාන සූත්‍රයේ අන්තර්ගතය අනුව බොහෝ උගතුන් එය අයත් කරනු ලබන්නේ නවමු ගණයටය. එහෙත් කේ. ධම්මජෝති හිමි මෙය සෙසු බුද්ධ චරිත මූලාශ්‍රයවලට ආරම්භක පොදු මූලාශ්‍රයක් වූ බව පවසයි.[26] විනය මහා වග්ග පාළි මහා ඛන්ධකයේ බුද්ධත්වයේ පටන් සැරියුත් මුගලන් දෙනම අගසවු තනතුරෙහි තැබීම තෙක් බුද්ධ චරිතය හොඳින් විස්තර වේ. බෝධි කථාවෙන් ආරම්භ වී අජපල් නුගරුක් මුල් විසීම, ඉසිපතනයට වැඩීම, අතරමගදී උපක හමුවීම, ධම්මචක්ක දේශනාව පැවැත්වීම, යසකුල පුත්‍රයාගේ පැවිද්ද, සරණාගමන උපසම්පදාව, ජටිල දමනය, බිම්බිසාර රජු හමුවීම බඳු බුද්ධ චරිතයේ වැදගත් සිදුවීම් ඒකරාශී වී විවරණය කෙරේ. එසේම ඥත්ති චතුත්ථ කම්ම උපසම්පදාව බඳු තවත් කරුණු රාශියක් ඉදිරිපත් කරන අතර සතර අකරණීය ධර්ම විස්තරයෙන් මහා ඛන්ධකය නිමා වේ. සංඝ සමාජයේ සාමාජිකයන් හා නව ගැටලු වැඩි වන විට ඒවාට පිළිතුරු වශයෙන් අදහස් එකතු කිරීම ඛන්ධකයෙන් සිදු වී ඇතැයි සිතීමට පුළුවන. මේ වන විට සුත්ත විභංග සම්පූර්ණව තිබුණු නිසා ඒවා වෙනම ගොඩවල් වශයෙන් රාශිභූත කරන්නට ඇත. ඛන්ධකවල වර්ධනය 2 වන සංඝායනාවෙන් පසු නතර වූ බව පෙනේ. එසේ නොමැති නම් ඉන් පසු තොරතුරු ද විශේෂයෙන් තෙවන සංගායනා විස්තරය ද ඇතුළත් වන්නට තිබිණි. චුල්ලවග්ග පාලියේ xi වන ඛන්ධකයේ උභතො විනයක් ගැන සඳහන් වේ.[27] (එතෙනව උපායෙන උභතො විනයෝ පුච්ඡි) මෙහි උභතො විනය යනු සුත්ත විභංග හා ඛන්ධක බැව් විමල විජයසූරිය පවසයි.[28] එය එසේ නම් ඛන්ධකයන් ප්‍රථම සංගීතියේ දී සාකච්ඡාවට භාජනය වූ බව පිළිගැනීමට සිදු වේ. කෙසේ නමුත් මහාඛන්ධකයේ දැක්වෙන්නේ බුද්ධ චරිතය හා ශාසන ඉතිහාසය සම්බන්ධව ක්‍රමානුකූලව සකස් කරන ලද විවරණයකි. එම නිසා එය ද බෝසත් චරිතය සම්බන්ධ මුල් මූලාශ්‍ර තරම්ම පැරණි නැති බව කිව යුතුය.

දීඝ නිකායේ මහා සුදස්සන, මහා ගෝවින්ද, මඛාදේව යන සූත්‍රවල දී බෝසත් චරිතයේ සංවර්ධිත අවස්ථාවක් නිරූපණය කරනු ලබයි. මජ්ඣිම නිකායේ අච්ඡරිය අබ්භූත සූත්‍රයේ බෝසත් චරිතයේ ආශ්චර්ය අද්භූත සිදුවීම් රාශියක් දීඝ නිකායේ මහාපදාන සූත්‍රය අනුව යමින් ඉදිරිපත් කර තිබේ. උදාහරණ වශයෙන් බෝසත් මනා සිහි නුවණින් දෙව්ලොව උපත ලැබීම,[29] සෙම ලේ අසූචි නොගැටී පිරිසිදුව උපත ලැබීම[30] වැනි සාධක පෙන්වා දිය හැකිය. මජ්ඣිම නිකායේ බෝධිකුමාර සූත්‍රයේ දෙවියන් පැමිණ දුෂ්කර ක්‍රියා කරන බෝසතුන්ට රෝම කූප මගින් දිව්‍ය ඕජස් ලබා දීමට විචාරීම,[31] පධානංග විවරණය කර තිබීම හා දුෂ්කර ක්‍රියා වර්ණනය යන ලක්ෂණ අනුව මෙම සූත්‍රය සංවර්ධිත සමයට අයත් යැයි පැවසිය හැකිය. මජ්ඣිම නිකායේ අච්ඡරිය අබ්භූත, බෝධිරාජ හා මහා සීහනාද වැනි සූත්‍රවල බෝසතුන් සම්බන්ධව ආරෝපණය කළ හැකි සියලුම ආශ්චර්ය අද්භූත සිදුවීම් හා දිව්‍යමය ලක්ෂණ දීඝ නිකායේ මහාපදාන සූත්‍රයේ මෙන් විස්තරාත්මකව දක්වා ඇතැයි වින්ටර්නීට්ස් පවසයි.[32] මජ්ඣිම නිකායේ මහා සච්චක සූත්‍රය, අරියපරියේසන සූත්‍රය හා අංගුත්තර නිකායේ තික නිපාතයේ 38 වන සූත්‍රය මෙන් පැරණිම ස්තරයට වින්ටර්නීට්ස් විසින් අයත් කරනු ලැබුවත්[33] බෝධිරාජ කුමාර සූත්‍රයේ මෙන් දුෂ්කර ක්‍රියා හා පධානාංග සම්බන්ධව සංවර්ධිත අදහස් විද්‍යාමාන වන බැවින් මහා සච්චක සූත්‍රය අයත් කළ යුත්තේ පශ්චාත් සමයකටය.

බෝධිසත්ත්ව සංකල්පය පිළිබඳ පාලි සූත්‍ර මූලාශ්‍ර ස්තරීයකරණය එතරම් පහසු කටයුත්තක් නොවන්නේ එකම සූත්‍රයක සංකීර්ණ ලක්ෂණ විද්‍යමාන වීම නිසයි. සමහර සූත්‍රයක බෝසතුන් පිළිබඳ සරල මානුෂීය විග්‍රහයන් මෙන්ම ආශ්චර්ය අද්භූත සිදුවීම් හා දේව මාරාදීන්ගේ සම්බන්ධය ද අන්තර්ගත වේ. බෝසත් සංකල්පය සම්බන්ධ පැරණිම මූලාශ්‍රයයන් වශයෙන් පිළිගැනෙන මජ්ඣිම නිකායේ අරියපරියේසන සූත්‍රයේ පවා සහම්පති මහා බ්‍රහ්මයාගේ ආරාධනාව, සූත්‍රය අවසානයේ මාරයා ගැන සඳහන් වීම බඳු පශ්චාත් යුගයට අයත් කෙරෙන ලක්ෂණ විද්‍යමාන වී ඇත. මේ නිසා මූලාශ්‍රයවල කාලය නිර්ණය කිරීමේ දී එය ඉතා සංයමයෙන් කළ යුතුව ඇත.

සුත්ත නිපාතයේ මහා වග්ගයේ එන සූත්‍ර වැඩි ගණනක් ආදිකාලීන යැයි බොහෝ විචාරකයන් පෙන්වා දී ඇතත්[34] එහි ද පැරණි හා නවමු අදහස් සහිත මූලාශ්‍රය වේ. උදාහරණ වශයෙන් සුත්ත නිපාතයේ පධාන හා නාලක සූත්‍ර ද්වයය දැක්වීමට පුළුවන. පධාන සූත්‍රය පබ්බජ්ජා සූත්‍රයට අනතුරුව ඒ සමගම දැක්වීමෙන් උත්සාහ කරන්නට ඇත්තේ බුද්ධ චරිතයේ සිදුවීම් පෙළක් අඛණ්ඩව විස්තර කිරීම වන්නට ඇත. ඒ බව පබ්බජ්ජ සූත්‍රයේ අවසාන ගාථාවේ[35] හා පධාන සූත්‍රයේ මුල්ම ගාථාවේ හා පධාන සූත්‍රයේ මුල්ම ගාථාවේ[36] පාඨයන් පිරික්සීමෙන් ප්‍රකට වේ. මෙම සූත්‍රයෙන් බෝසතුන්ගේ පධන් වීර්යය කියැවේ. මජ්ඣිම නිකායේ අරියපරියේසන සූත්‍රයේ බෝසතුන් දුෂ්කර ක්‍රියා අත්හරින තැන මාරයා ගැන සඳහන් නොවේ. මාරයා (මාර සේනාව) පුද්ගල හා ක්ලේශ යන ස්වරූප දෙකකින්ම සූත්‍රවල පිළිබිඹු වන අතර ක්ලේශ මාර යන්න වඩාත් පැරණි යුගයට ඇතුළත් කරනු ලබයි.[37] පධාන සූත්‍රයේ මෙම ස්වරූප දෙකම විද්‍යමාන වන අතර එහි මාර පරාජය වශයෙන් වඩාත් ඉස්මතු කෙරෙන්නේ බෝසතුන් කාමාදී කෙලෙස් සමග කරන සටනයි. මේ මාර කථාව මාර සංග්‍රාමයක් ලෙසින්ම පසුකාලීන ග්‍රන්ථවල පෙන්වා දී ඇත.[38] පධාන පබ්බජ්ජා හා අරියපරියේසන යන සූත්‍රවල බෝසතුන්ගේ දුෂ්කර ක්‍රියා පිළිබඳ දීර්ඝ විස්තර වර්ණනා නොමැති වීම සුවිශේෂී ලක්ෂණයක් වන අතර එය පෞරාණික සාධකයක් වශයෙන් ද පෙන්වා දීමට පුළුවන. පධාන සූත්‍රයෙහි පවා ඇත්තේ චතුරංග සමන්නාගතා වීර්යය ගැන පමණි.[39] බෝධිසත්ව චරිතයේ සංකීර්ණ ලක්ෂණ සහිත මූලාශ්‍රයය ගණයට පධාන සූත්‍රය මෙන්ම නාලක සූත්‍රය ද ඇතුළත් කළ හැකිය.[40] එය අසිත තාපසයාගේ කථාව, වත්ථු ගාථා හා බුදුරදුන්ගේ ධර්ම දේශනයකින් ද සමන්විත වේ. සුත්ත නිපාතයේ සූත්‍රයන් විස්තර කිරීම සඳහා එන ගද්‍ය කොටස් එම සූත්‍රවල පද්‍ය කොටස්වලට වඩා පසුකාලීන විය යුතු බව පිළිගැනේ.[41] නාලක සූත්‍රයේ සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය නිසා දේව සන්තුෂ්ටිය, අසිත නම් ඍෂිවරයා සුදොවුන් රජුගේ මාලිගාවට පැමිණීම පසුව ඔහු තම බෑනනුවන් වූ නාලක කුමරුට දුන් අවවාදය යන කොටස් පසුකාලීන බැව් ඊ.ජේ. තෝමස් පවසයි.[42] නාලක සූත්‍රයේ 5 වැනි කොටසේ ''බෝධිසත්ත්ව'' යන පදය සිදුහත් කුමරුට යෙදී ඇත.[43]

මෙම සූත්‍රයේ බෝසත් චරිතයට හා සෙසු කොටස්වලට දේව ආභාසය ඉතා තදින්ම ලබා ගෙන ඇත. එය කොතරම් ද කිවහොත් එහි ඓතිහාසික භාවය පවා වැසී යන අයුරින් මිථ්‍යා කථාවලින් පිරී ඇත.

බෝධිසත්ත්ව සංකල්පය සම්බන්ධ මිශ්‍ර මූලාශ්‍රය ගණයටම අන්තර්ගත කළ හැකි තවත් සූත්‍රයකි දීඝ නිකායේ මහා පරිනිර්වාණ සූත්‍රය. එහි බෝසතුන්ගේ මානුෂීය හා අතිමානුෂීය යන උභයාංශය මැනවින් ආරෝපණය කර ඇත. සංයුක්ත නිකායේ ආ කෙටි පරිනිර්වාණ සූත්‍රයම වර්ධනය කර ගැනීමක් වශයෙන් රිස් ඩේවිස් විස්තර කර ඇත.[44] ශ්‍රී ලංකාවේ දී පවා එකතු කළ ගාථා ද ඇති බව එම අටුවාව පවසයි.[45]

බෝධිසත්ත්ව සංකල්පය ගවේෂණයේ දී වැදගත් වන තවත් පාලි මූලාශ්‍රය ග්‍රන්ථ කීපයක් නම් බුද්ධවංස, චරියාපිටක හා අපදානයයි. බුද්ධවංසයේ බුදුවරුන් සංඛ්‍යාව 24 දක්වා පාලි මූලාශ්‍රයවල වර්ධනය කර ඇත. අවසානයේ 35 කි. දීඝ නිකායේ මහාපදාන සූත්‍රයේ ආ බුදුවරුන් 7 සංඛ්‍යාව මෙසේ 24 දක්වා පාලි මූලාශ්‍රයවල වර්ධනය වී ඇති බව ප්‍රකට වේ. සමහර විට මෙය ජෛන මූලාශ්‍රය ආභාසයෙන් සිදුවන්නට ද ඇත. පැරණි නිකාය ග්‍රන්ථවල පාරමිතා එකක් වත් සඳහන් නොවේ.[46] එහෙත් චරියා පිටකයේ 7 ක් ද බුද්ධවංසයේ 10 ක් ද අපදානයේ 30 ක් ද දක්වා වර්ධනය කර ඇත. මහාසංඝිකාදී අනෙක් නිකායයන් අතර පාරමිතා බෝධිසත්ත්ව ගුණාදිය ප්‍රකට වූවායින් පසු මෙම ග්‍රන්ථ ථෙරවාදීන් විසින් විස්තර කරන්නට ඇතැයි සාමාන්‍ය පිළිගැනීමයි. බුද්ධ, බෝධිසත්ව සංකල්පයන්හි වර්ධනීය ස්වරූපයක් පිළිබිඹු කරන බැවින් මෙම ග්‍රන්ථ පශ්චාත් යුගයකට අයත් කෙරේ.

බෝසත් චරිතය පිළිබඳ ත්‍රිපිටකයේ තැන් තැන්වල ආ විවිධ විස්තර විවරණයන් ඒකරාශී කොට තනි බෝධිසත්ත්ව අපදානයක් වශයෙන් ජාතක අටුවාවේ කථා නිදානය ගොඩනගා ඇත. මෙකී මූලාශ්‍රයවල බහුල වශයෙන් විද්‍යමාන වන්නේ ත්‍රිපිටකයේ දියුණු ලක්ෂණ දරන සංකීර්ණ සූත්‍ර හා මහායාන බුදු සමයේ සංවර්ධිත ලක්ෂණ දරන මූලාශ්‍රයවල ආභාසයයි. ක්‍රි.ව. 5 වන සියවසින් පසු රචනා කෙරෙන පාලි අටුවාවලට ද මෙකී දෙඅංශයෙහිම මූලාශ්‍ර බලපාන්නට ඇති බව පැහැදිලිය. ඒවායේ එන සුරංගනා දේව කථා හා ආශ්චර්ය අද්භූත සිදුවීම් සාධක වශයෙන් ඉදිරිපත් කළ හැකිය. එහෙත් බෝසත් චරිතය වටා ගොඩනැගී තිබෙන විවිධ අවස්ථා නිසා සිදුවීම් හා දේව මාරාදී ප්‍රවෘත්තිවල ආරම්භය බුද්ධ කාලයේ සිටම සිදු වූවාට සැකයක් නැත. බෝසත් චරිතයට සම්බන්ධ සෑම මූලාශ්‍රයකම පාහේ එබඳු සිදුවීම් දක්නට ලැබීමෙන් එය වඩාත් තහවුරු වේ. බොහෝ විද්වතුන්ගේ අදහස වන්නේ මහායාන බලපෑමෙන් එම අදහස් සුපිරිසිදු ථෙරවාදී මූලාශ්‍රවලට ඇතුළත් වන්නට ඇති බවත් මෙබඳු ප්‍රවෘත්තිවල ආරම්භය නිකායාන්තර බුදු සමය ආරම්භ වන්නටත් පෙර යුගයකට අයත් විය යුතු බවත්ය. සෑම නිකායක් තුළම බෝසතුන්ගේ ආශ්චර්ය අද්භූත ලක්ෂණ විද්‍යමාන වන බැවින් මෙම ලක්ෂණ නිකායාන්තර බුදු සමයේ ආරම්භයට පෙර සිටම පැවැති බව නිගමනය කළ හැකිය. නිකායාන්තරිකයන් අතින් මෙම අදහස් තව දුරටත් වර්ධනය වූවාට සැක නැත.

බෝසතුන් සම්බන්ධ මෙබඳු අදහස් ප්‍රභවය වන්නේ උන්වහන්සේගේ සමයේම විය යුතුය. ඒ ඒ පුද්ගලයන් බුදුරදුන් දෙස බැලූ ආකාරය මීට පසුබිම වන්නට ඇත. උදාහරණ වශයෙන් බ්‍රහ්මායු සූත්‍රයේ එන විවරණය දැක්විය හැකිය. එහි විසි වයස් බ්‍රහ්මායු නම් බමුණු පඬිවරයා තම බමුණු

ශාස්ත්‍රයේ ආ මහාපුරුෂ ලක්ෂණ බුදුරදුන්ට ආරෝපණය කරමින් උන්වහන්සේ හඳුනා ගන්නට ඇත.[47] අම්බට්ඨ සූත්‍රයේ[48] ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් පරිදි සාමාන්‍ය කාමභෝගී පිරිස් බුදුරදුන් දෙස බැලූ ආකාරය සහ දැන උගත් භික්ෂූන් බැලූ ආකාරය සම්පූර්ණයෙන්ම වෙනස් වන්නට ඇත. බුද්ධිමත් ශ්‍රාවකයන් උන්වහන්සේ ගැඹුරින් අවබෝධ කර ගන්නට ඇති අතර නූගත් සාමාන්‍ය ජනයා තම ආගමික මති මතාන්තර හා විශ්වාස ආරෝපණය කරමින් බුදුරදුන් ගැන සිතන්නට ඇත. මේ නිසා බුද්ධියෙන් මුහුකුරා ගිය ශ්‍රාවකයන් බුදුරදුන් පිළිබඳව යථාර්ථවාදී විමර්ශනයක නියැලුණු අතර සාමාන්‍ය ජනතාවට උන්වහන්සේ අතිමානුෂීය දේවාති දේව උතුමෙකි. මේ අයුරින් බුදුරදුන් වටා දෙයාකාරයක විවරණයක් ඉදිරිපත් කරන්නට ඇත. බුදුරදුන් ජීවමාන සමයේම ඇති වූ මෙම තත්ත්වය උන්වහන්සේගේ ඇවෑමෙන් පසු වඩාත් වේගයෙන් වර්ධනය වන්නට ඇත. මහායාන බුදුසමය මගින් මෙය උපරිම භාවයට නැංවෙන්නට ඇත. එහි ප්‍රතිඵලය වූයේ උන්වහන්සේ සර්ව බලධාරි දෙවියකු බවට පත්වීමයි. එහෙත් ථෙරවාදී සම්ප්‍රදාය කොතරම් අද්භූත ජනක සිදුවීම්වලින් හා සුරංගනා කථාවලින් බුද්ධ චරිතය සැරසුවත් උන්වහන්සේ මනුෂ්‍යයකු බව අමතක කර නොමැත.

පාලි මූලාශ්‍රය අතර තවත් වැදගත් ග්‍රන්ථ කීපයක් වශයෙන් සම්පිණ්ඩිත මහා නිදානය, ජින චරිතය, ජිනාලංකාරය, ජිනවංස දීප මහා කාව්‍ය සඳහන් කළ හැකිය. මේවා අටුවා යුගයෙන් පසු රචිත බැවින් ඊට පෙර මූලාශ්‍රයවල සියලුම ලක්ෂණ පසුබිම් කරගෙන තිබෙන බව පෙන්වා දිය හැකිය.

## පාදක සටහන්

1 මජ්ඣිම නිකාය 1 (බුද්ධ ජයන්ති සංස්කරණය) ''අරිය පරියේසන සුත්ත'' 440 පි.
''සො බො අහං භික්ඛවෙ අපරෙන සමයෙන දහරොව සමානො සසුකාළ කෙසො භද්‍රෙන යොබ්බනේන සමන්තාගතො පඨමේන වයසා අකාමකානං මාතා පීතුන්නං අස්සුමුඛානං රුදන්තානං කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනාගාරියං පබ්බජිං''

2 එම, 410 පි.
''උයෛහි වීරවිජිතං සංගාම ඡත්තවාහ අනණ විචර ලොකෙ දෙසස්සු භගවා ධම්මං අඤ්ඤාතාරො භවිස්සන්ති''

3 එම, 422 පි.
''අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අන්ධමකාසි මාරං අපදං වධිත්වා මාර චක්ඛුං අදස්සනං ගතො පාපිමතො''

4 ෂුත්ත නිපාත (බු.ජ.ස) පබ්බජ්ජා සුත්ත, 122 පි.
''සම්බාධොයං ඝරාවාසො රජස්සායතනං ඉති අබ්භොකාසොව පබ්බජ්ජා ඉති දිස්වාන පබ්බජි''

5 එම.
''අගමො රාජගහං බුද්ධෝ මගධානං ගිරිබ්බජං පිණ්ඩාය අභිහාරෙයි ආකිණ්ණවර ලක්ඛණො''

6 එම.
''පිණ්ඩාචාරං චරිවානනක්ඛම්ම නගරා මුනි පණ්ඩවං අභිහාරෙසි එත්ථවාසො භවිස්සති''

7 එම.
''භික්ඛු මහාරාජ පණ්ඩවස්ස පුරක්ඛතො නිසින්නෙ ව්‍යාඝ්‍රසභෙව සීහොව ගිරිබ්බජෙ''

8 Jayawickrama N.A., "Sutta Nipatha : The Narative Ballads", Colombo University of Ceylon Review, 1945, Vol. iii, No. 3, p. 182.

9 Ibid, pp. 182-183.

10 Ibid.

11 Ibid.

12 සුත්ත නිපාත (බු.ජ.ස) පබ්බජ්ජා සුත්ත, 124 පිට.
''යුවාච දහරොවාසි පඨහමුප්පත්තිතො සුසු
වණ්ණාරොහෙන සම්පන්නෝ ජාතිමා විය ඛත්තියො''

13 එම, 124 පි. ''නාග සංඝපුරක්ඛතො''

14 University of Ceylon Review, Vol. iii, No. 3, p. 183.

15 Suttanipata ed. Lord Charmers, London, The Havard Oriental Series, 1932, Vol. 37, p. 101.

16 Winternitz, M.A., History of Indian Literature, Delhi, Motial Banarisidasa Ltd., 1993, Vol. ii, p. 93.

17 Suttanipata ed. Faus Ball, Sacred Books of East. X, London, The Havard Oriental Series, 1932, Vol. 37, p. xvi.

18 Abeynayake Oliver A. Textual and Historical Analysis of the Khuddaka Nikaya, Dehiwala Tisara Press, 1984, p. 77.

19 Pande, G.C. Studies in the Orgins of Buddhism, Delhi, Motilal Banarisidass, 1995, 4th Edition, p. 60.

20 History of Indian Literature, as above, Vol. II, p. 41.

21 Ibid.

22 Ibid.

23 Studies in the Orgins of Buddhism, as above, p. 94.

24 Ibid.
"The title itself of the Sutta "Mahapadana" Suggests its Lateness, The Padnas became a popular lateron."

25 Ibid. "Its quite foreign to the earliest texts and must have developed."

26 Dhammajothi K. "The Mahapadana Sutta and the Buddha Spitirural lignese", Sri Lanka Journal of Buddhist Studies (Buddhist and Pali University of Sri Lanka) 2000, vol. I, "It would seen more likely that this discourse must have been originally the lending discourse in the common version (at least the common Vibajjavadin) serving as a grand prologue to the whole collection as it does in the chines version."

27 චුල්ලවග්ග පාළි, xi වන ඛන්ධකය (බු.ජ.ස) ''එතෙනව උපායෙන පඤ්ඤ පි නිකායෙ පුච්ඡි''

28 විජේසූරිය විමල, ''ත්‍රිපිටක සාහිත්‍යය පිළිබඳ සම්ප්‍රදායගත වර්ගීකරණ, බෞද්ධ සංස්කෘති විචාර, සංස් : කෝට්ටගොඩ සිරිනන්ද හිමි, මාතර, 1969, පි. 58.

29 මජ්ඣිම නිකාය III (බු.ජ.ස) අච්ඡරිය අබ්බුත්ත සුත්ත, 288 පි. ''සතො සම්පජානෝ''

30 එම, 292 පි. අමක්ඛිතො සෙම්හෙන...''

31 මජ්ඣිම නිකාය III (බු.ජ.ස) අච්ඡරිය අබ්බුත්ත සුත්ත, 496 පි. ''බෝධිරාජකුමාර සුත්ත'' දිබ්බං ඔජං ලොමකූපෙහි අජ්ඣොහරිස්සාම''

32 H.I.L. Vol. II, p. 49.

33 Ibid.

34 බලන්න ෆවුල් බෝල් මහතා විසින් සංස්කරණය කරන ලද ඉංග්‍රීසි සුත්ත නිපාතයේ ප්‍රස්ථාවනාව.

35 සුත්ත නිපාත (බු.ජ.ස) 124 පි.

36 එම, 126 පි. තං මං පදාන පහිතත්තං.

37 ධම්මරතන හිමි බී. ''මාර සංකල්පය'' මාගධී මංගල කලාපය, කැලණිය, 1963, 1 පි.

38 සුත්ත නිපාත අටුවාව, හේවාවිතාරණ මුද්‍රණය.

39 සුත්ත නිපාත (බු.ජ.ස) 128 පි.

40 Jayawickrama N.A., "The Vaggas of the Sutta Nipata, University of Ceylon Review, Vol. vi, No. 4, p. 245.

41 Ibid.

42 Thomas E.J. The life of the Buddha as Legend and History, London, Trotledge and Kegan Paul, 1949, pp. 38, 39, 3rd Edition.

43 සුත්ත නිපාත (බු.ජ.ස) 214 පි, ''බෝධිසත්ත රතනවරො අතුලෙ‍‍ය්‍යා''

44 David Rhys. "The Dialogous of Buddha" Introduction to the Book of the Great decease, 1899-1921, vol. I, part II, pp. 71-72.

45 දීඝනිකාය අටුවාව 1 (හේ.වි.මු.) 432 පි. ''අට්ඨදෝණං චක්ඛුමතො සරීරං ති ආදි ගාථායො පන තම්බපණ්ණි ථෙරෙහි වුත්තා''

46 ඤාණතිලක හිමි තිස්ස, බුදුවරුන්ගේ පහළ වීම සහ ඓතිහාසික තොරතුරු ''නිවන් මඟ' බුද්ධිහිවාදන අංකය, 13 වන කලාපය (ර.මු. බෞ. සංගමය, බුද්ධ වර්ෂ 2526) 12 පි.

47 මජ්ඣිම නිකාය (බු.ජ.ස.) බ්‍රහ්මායු සුත්ත, 578 පි.

48 දීඝ නිකාය (බු.ජ.ෂ.) අම්බට්ට සුත්ත, 152 පි.